# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.26 පැය 1535 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1889/2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**විශේෂ රථවාහන මෙහෙයුම සම්බන්ධව - රථවාහන මූලස්ථානය.**

උත්සව සමයේ රථවාහන අනතුරු අවම කර ගැනීමේ අරමුණින් වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි විශේෂ රථවාහන මෙහෙයුමක් 2024.12.20 වන දින සිට දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කර ඇත.

2024.12.25 වන දින පැය 0600 සිට 2024.12.26 වන අද දින පැය 0600 න් අවසන් වූ පැය 24 ක කාලය තුල විශේෂ රථවාහන මෙහෙයුම මඟින් බීමත් රියදුරන් 395 දෙනෙකු අපරීක්ෂාකාරී හා අන්තරාදායක ලෙස රිය පැදවීමට අදාල රියදුරුන් 50 දෙනෙකු, අධික වේගයෙන් රිය පැදවීම සම්බන්ධව රියදුරන් 120 දෙනෙකු මාර්ග නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රියදුරන් 1262 ක්, බලපත්‍ර වැරදි සම්බන්ධ රියදුරන් 682 ක් සහ වෙනත් රථවාහන වැරදි සම්බන්ධයෙන් රියදුරන් 5441 ක් වශයෙන් සමස්ත රථවාහන වැරදි සම්බන්ධයෙන් රියදුරන් 7950 ක් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කර ඇත.

මින් ඉදිරියට සෑම අවස්ථාවකදීම බීමත්ව රිය පැදවීම හේතුවෙන් අත්අඩංගුවට ගන්නා රියදුරන්ගේ රියදුරු බලපත්‍රය මාස 12ක කාලයක් සඳහා අත්හිටුවීමට හෝ රියදුරු බලපත්‍රය අවලංගු කරන ලෙසට ගරු අධිකරණයෙන් ඉල්ලා සිටීමට පොලිසිය විසින් කටයුතු කරනු ලබන අතර ඒ බැවින් බීමතින් රිය ධාවනය නොකරන ලෙස ශ්‍රී ලංකා පොලිසිය සියළුම රියදුරන්ගෙන් ඉල්ලා සිටියි. මෙම විශේෂ මෙහෙයුම තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**